රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:-7/2005

මගේ අංකය:- අා8/5/719/39(ශ්‍රී)
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් මාවත,
කොළඹ 07.

හදිසියි

2005.03.30

11 APR 2005

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## 2004.12.26 දින මුහුදු ගොඩගැලීමෙන් මියගිය හෝ අතුරුදහන්ව සිටින රාජ්‍ය සේවකයින්ගේ යැපෙන්නන් සඳහා සහන සැලසීම

2004.12.26 දින මුහුදු ගොඩගැලීම නිසා මියගිය හෝ අතුරුදහන්වී ඇති රාජ [redacted]
ස්ථිර නිලධාරීන්ගේ යැපෙන්නන්ට දැනට පවතින හිමිකම්වලට අතිරේකව පහ [redacted]
පරිදි සහන සැලසීමට රජය තීරණය කර ඇත.

අ. මියගිය හෝ අතුරුදන් වූ නිලධාරියා ජීවත්ව සිටිමින් සේවයේ රැඳී සිටියේ නම් ඔහුට වරින් වර ලද හැකිව තිබූ වැටුප් වැඩිවීම් හා දීමනා ද ඇතුළුව ඔහු මරණයට පත්වූ හෝ අතුරුදන් වූ හෝ දිනයේදී ඔහුට ගෙවන ලද සම්පූර්ණ වැටුප හා දීමනාව ඔහු ජීවත්වන්නෙකු සේ සලකා අවු. 55 දක්වා ගෙවීම

සටහන :- යැපෙන්නන් ලෙස සලකනුයේ නිලධාරියා විවාහක නම් කලත්‍රයාද, කලත්‍රයා මිය ගොස් ඇත්නම් අවුරුදු 26 ට අඩු අවිවාහක දරුවනුත් වේ. නිලධාරියා අවිවාහක නම් දෙමව්පියන් ද, මව්පිය දෙදෙනා ම මිය ගොස් ඇත්නම් අවුරුදු 26 ට අඩු ඔහුගේ අවිවාහක සහෝදරයෝ ද රැකියා විරහිත අවිවාහක සහෝදරියෝ ද වෙති.

02. මෙම චක්‍රලේඛය යටතේ යැපෙන්නන් වෙත ගෙවනු ලබන වැටුපෙන් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අය නොකළ යුතුය.

03. අතුරුදහන්වූ හෝ මියගිය හෝ නිලධාරියා වෙනුවෙන් 1993.09.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 විධිවිධාන පරිදි හදිසි අනතුරු වන්දි ගෙවනු ලබන්නේ නම් මෙම ක්‍රමය යටතේ වැටුප් ලබා ගැනීමට යැපෙන්නන්ට හිමිකමක් නොමැත.

ඩී. දියානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශකටයුතු අමාත්‍යාංශය

k/new/k-vahana